# ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලය

## දෙමළ භාෂා සහතික පත්‍ර පාඨමාලා/දෙමළ භාෂා ඩිප්ලෝමා පාඨමාලා - 2023

ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලයේ පශ්චාද් උපාධි අධ්‍යයන පීඨය හා බාහිර විභාග මධ්‍යස්ථානය මඟින් 2023 වර්ෂයේ පැවැත්වීමට නියමිත දෙමළ සහතික පත්‍ර පාඨමාලා/දෙමළ භාෂා ඩිප්ලෝමා පාඨමාලා සඳහා ලියාපදිංචි වීමට කැමැති අපේක්ෂකයන්ගෙන් 2022.12.30 දින දක්වා අයදුම්පත් කැඳවනු ලැබේ.

**01. දෙමළ භාෂා සහතික පත්‍ර/උසස් සහතික පත්‍ර පාඨමාලා**

**02. දෙමළ භාෂා ඩිප්ලෝමා පාඨමාලාව**

**02. දෙමළ භාෂා උසස් ඩිප්ලෝමා පාඨමාලාව**

**ලියාපදිංචිය සඳහා සුදුසුකම්:**

**දෙමළ භාෂා සහතික පත්‍ර පාඨමාලාව**

- වයස අවුරුදු 16 සම්පූර්ණ කළ දෙමළ භාෂාව ඉගෙනීමට උනන්දුවක් දක්වන ඕනෑම අයෙකුට අයදුම් කළ හැකිය.

**දෙමළ භාෂා උසස් සහතික පත්‍ර පාඨමාලාව**

- අ.පො.ස. සාමාන්‍ය පෙළ විභාගය විෂයයන් හයකින් (06) සමත් වීම සහ මෙම විශ්වවිද්‍යාලය මඟින් පවත්වනු ලබන ශ්‍රේණිගත කිරීමේ පරීක්ෂණයෙන් සමත් වීම.

**හෝ**

- මෙම විශ්වවිද්‍යාලය මඟින් පවත්වනු ලබන දෙමළ භාෂා සහතික පත්‍ර පාඨමාලාව සමත් වීම.

**දෙමළ භාෂා ඩිප්ලෝමා පාඨමාලාව - SLQF Level 3 - 30 Credits**

- අ.පො.ස. සාමාන්‍ය පෙළ විභාගය දෙමළ භාෂාව ඇතුළු ව සමත් වීම සහ මෙම විශ්වවිද්‍යාලය මඟින් පවත්වනු ලබන ශ්‍රේණිගත කිරීමේ පරීක්ෂණයෙන් ලකුණු 70% ක් හෝ ඊට ඉහළ ලකුණු ලබා සමත් වීම.

**හෝ**

- මෙම විශ්වවිද්‍යාලය මඟින් පවත්වනු ලබන දෙමළ භාෂා උසස් සහතික පත්‍ර පාඨමාලාව සමත් වීම.

**දෙමළ භාෂා උසස් ඩිප්ලෝමා පාඨමාලාව**

**SLQF Level 04 – 30 Credits**

- පිළිගත් විශ්වවිද්‍යාලයකින් හෝ පිළිගත් අධ්‍යාපන ආයතනයකින් දෙමළ භාෂා ඩිප්ලෝමාවක් ලබා තිබීම.

**හෝ**

- දෙමළ භාෂා විෂයය ඇතුළු ව (අ.පො.ස.) උසස් පෙළ විභාගය සමත් වීම.

**හෝ**

- මෙම විශ්වවිද්‍යාලය මඟින් පවත්වනු ලබන දෙමළ ඩිප්ලෝමාව සම්පූර්ණ කළ අය හැර අනෙකුත් අපේක්ෂකයන් උක්ත සඳහන් සුදුසුකම්වලට අමතර ව ශ්‍රේණිගත කිරීමේ පරීක්ෂණයකට පෙනී සිට 70% ක් හෝ ඊට ඉහළ ලකුණු ලබා සමත්වීම.

**ශ්‍රේණිගත කිරීමේ පරීක්ෂණය :**

2023.01.28 දින ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලය (පශ්චාද් උපාධි අධ්‍යයන පීඨය සහ බාහිර විභාග අධ්‍යයන මධ්‍යස්ථානය), 214, බෞද්ධාලෝක මාවත, කොළඹ-07, පරිශ්‍රයේ දී පවත්වනු ලැබේ. මෙම පරීක්ෂණයේ දී දක්වන කුසලතාව මත සිසුන් අදාළ පාඨමාලා සඳහා තෝරා ගනු ලැබේ.

**පාඨමාලා ගාස්තු**

| | | |
|---|---|---|
| දෙමළ භාෂා සහතික පත්‍ර පාඨමාලාව | - | රු. 20,000/- |
| දෙමළ භාෂා උසස් සහතික පත්‍ර පාඨමාලාව | - | රු. 25,000/- |
| දෙමළ භාෂා ඩිප්ලෝමා පාඨමාලාව | - | රු. 31,000/- |
| දෙමළ භාෂා උසස් ඩිප්ලෝමා පාඨමාලාව | - | රු. 36,000/- |

(විශ්වවිද්‍යාලය වෙත මේ සම්බන්ධ ව ගෙවූ කිසිදු මුදලක් ආපසු නොගෙවනු ලබන බව කරුණාවෙන් සලකන්න.)

## පාඨමාලා ආරම්භය හා පවත්වන ස්ථානය

දෙමළ භාෂා සහතික පත්‍ර/උසස් සහතික පත්‍ර/ඩිප්ලෝමා/උසස් ඩිප්ලෝමා පාඨමාලාවල දේශන සෑම සෙනසුරාදා දිනකම පශ්චාද් උපාධි අධ්‍යයන පීඨය හා බාහිර විභාග මධ්‍යස්ථානය, ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලය, 214, බෞද්ධාලෝක මාවත, කොළඹ 07 ස්ථානයේ දී පැවැත්වේ.

**පාඨමාලා කාල සීමාව :** අවුරුදු 01

## අයදුම්පත් ලබාගත හැකි ආකාරය

දිවයිනේ ඕනෑම ලංකා බැංකු ශාඛාවකින් හෝමාගම ලංකා බැංකු ශාඛාවේ ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලයේ ගිණුම් අංක **711202**, දරණ ගිණුමට බැර වන පරිදි රු.500/-ක් ගෙවා ලබා ගන්නා ලද ලදුපත ඉදිරිපත් කිරීමෙන් හෝ විශ්වවිද්‍යාලයේ සරප් වෙත අදාළ ගාස්තු ගෙවා ලබා ගන්නා ලද ලදුපත 2022.12.30 දින දක්වා වැඩකරන දිනයන්හි ප.ව. 3.00 ට පෙර අංක **214, බෞද්ධාලෝක මාවත, කොළඹ 07 හි පිහිටි ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලයේ පශ්චාද් උපාධි අධ්‍යයන පීඨය හා බාහිර විභාග අධ්‍යයන මධ්‍යස්ථානයට** ඉදිරිපත් කිරීමෙන් ඉහත සඳහන් පාඨමාලා සඳහා අයදුම්පත් හා විස්තර ලබා ගත හැකි ය.

තැපැල් මඟින් අයදුම්පත් හා විස්තර ලබා ගැනීමට අපේක්ෂා කරන්නේ නම් අයදුම්පත් ගාස්තු ඉහත සඳහන් ගිණුම් අංකයට බැර කර ලබා ගත් ලදුපත සමඟ නම, ලිපිනය ලියන ලද 9"x 4" ප්‍රමාණයේ ලියුම් කවරයක් රු.110/-ක මුද්දර අලවා පහත සඳහන් ලිපිනයට එවීමෙන් ලබා ගත හැකි ය.

**චෙක්පත් හෝ තැපැල් ඇණවුම් භාර ගනු නොලැබේ.** අයදුම්පත් ලබා ගැනීම සඳහා එවනු ලබන කවරයේ වම් පස ඉහළ කෙළවරේ **පාඨමාලාවේ නම සඳහන් කර - "අයදුම්පත්‍ර ලබා ගැනීම යනුවෙන්"** සඳහන් කළ යුතු ය.

**සහකාර ලේඛකාධිකාරී,**
**පශ්චාද් උපාධි අධ්‍යයන පීඨය හා**
**බාහිර විභාග මධ්‍යස්ථානය ,**
**ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලය,**
**නො. 214, බෞද්ධාලෝක මාවත, කොළඹ 07.**

අන්තර්ජාලයේ www.bpu.ac.lk දරන විශ්වවිද්‍යාලයීය වෙබ් අඩවියෙන් ද අයදුම්පත් ලබා ගත හැකි ය. එසේ ලබා ගන්නා අයදුම්පත් විශ්වවිද්‍යාලයට භාරදීමේ දී අයදුම්පත් ගාස්තු ඉහත සඳහන් ගිණුම් අංකයට බැර කර ලබා ගත් ලදුපත සමග ඉදිරිපත් කළ යුතු ය.

**සැ.යු. - බැංකුවට මුදල් ගෙවීමේ දී ලදුපතෙහි තැන්පත්කරුගේ නම සඳහන් ස්ථානයේ**

**ඉදිරියෙන් " T/Dip " යන සංකේතය සඳහන් කර ඒ යටතේ ගෙවීම කළ යුතු ය.**

අයදුම්පත් භාර ගන්නා අවසාන දිනය 2022.12.30 වන දින වේ. නිසියාකාර ව සම්පූර්ණ කරන ලද අයදුම්පත් උක්ත ලිපිනයට යොමු කළ යුතු ය. අයදුම්පත් ලියාපදිංචි තැපෑලෙන් පමණක් එවිය යුතු ය. **අයදුම්පත් භාර ගන්නා අවසාන දිනයෙන් පසු ව ලැබෙන අයදුම්පත් හා අසම්පූර්ණ අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.**

**වැඩි විස්තර:** 011-2580609 / 011-2502944 **පාඨමාලා සමායෝජක :** 071-9634236

ලේඛකාධිකාරී, (වැ.බ)
ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලය,
214, බෞද්ධාලෝක මාවත, කොළඹ 07.